**සී/ස ශ්‍රී ලංකා තරුණ සේවා පුද්ගලික සමාගම - 2020/2021**

**------------------------------------------------------------------**

සී/ස ශ්‍රී ලංකා තරුණ සේවා පුද්ගලික සමාගමේ 2021 මාර්තු 31 දිනෙන් අවසන් වර්ෂයේ මෙහෙයුම් කටයුතු පිළිබඳව ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාව සමග සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන ප්‍රකාරව මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 (6) ව්‍යවස්ථාව ප්‍රකාරව මා විසින් පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

**1.2 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම පිළිබඳ කළමනාකරණයේ සහ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම.**

**------------------------------------------------------------------**

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) වගන්තිය ප්‍රකාරව, සෑම විගණනය කරනු ලබන අස්ථිත්වයක් විසින්ම එම අස්ථිත්‍ය සම්බන්ධව වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය. එම පනතේ 16(2) වගන්තිය ප්‍රකාරව, සෑම විගණනය කරනු ලබන අස්ථිත්‍යයක් සම්බන්ධයෙන් වූ වාර්ෂික මූල්‍ය ප්‍රකාශ, රීති මඟින් දක්වනු ලැබිය හැකි පරිදි වන කාලසීමාවක් තුළ එම අස්ථිත්‍යවල වාර්ෂික කාර්ය සාධන වාර්තා ද සමඟ ප්‍රධාන ගණන්දීමේ නිලධාරියා විසින් විගණකාධිපතිවරයා වෙත ඉදිරිපත් කළ යුතුය. එම පනතේ 38(1) (ඇ) වගන්තිය ප්‍රකාරව, වාර්ෂික වාර්තා සහ වෙනත් මූල්‍ය ප්‍රකාශ අවශ්‍ය වේලාවන් ඇතුළත පිළියෙළ කිරීමට සිදුවන බව සහතික විය යුතු අතර ඊට අමතරව විගණනය කරනු ලබන අස්ථිත්‍යයට අදාල වාර්ෂික වාර්තා පාර්ලිමේන්තුවට ඉදිරිපත් කිරීමට ප්‍රධාන ගණන් දීමේ නිලධාරියා වගබලා ගනු ලැබිය යුතුය.

**2. වෙනත් නෛතික හා නියාමන අවශ්‍යතා පිළිබඳ වාර්තාව**

**------------------------------------------------------------------**

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ සහ 2007 අංක 7 දරන සමාගම් පනතේ පහත සඳහන් අවශ්‍යතාවයන් සම්බන්ධයෙන් විශේෂ ප්‍රතිපාදන ඇතුළත් වේ.

2007 අංක 07 දරණ සමාගම් පනතේ 150 (1) වගන්තියට අනුව, ශේෂ පත්‍රයේ දින සිට මාස 06 ක් ඇතුළත මූල්‍ය ප්‍රකාශන පිළයෙළ කිරීම සඳහා වගකිව යුතු පුද්ගලයා විසින් සහතික කරන බවට සමාගමේ අධ්‍යක්ෂ මණ්ඩලය සහතික විය යුතුය.

**2.1 මූල්‍ය ප්‍රකාශන**

**----------------**

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 2003 ජූනි 02 දිනැති අංක පීඊඩී/12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ 6.5.1 වගන්තිය ප්‍රකාරව, රාජ්‍ය සමාගම්වල වාර්ෂික මූල්‍ය ප්‍රකාශන ගිණුම් වර්ෂය අවසන්වී දින 60 ක් ඇතුළත විගණකාධිපති වෙත ඉදිරිපත් කළ යුතු වුවත්, සමාගම විසින් 2018 / 2019, 2019 / 2020, 2020 / 2021 සහ 2021 / 2022 යන ගිණුම් වර්ෂයන්ට අදාල මූල්‍ය ප්‍රකාශන 2022 සැප්තැම්බර් 15 දින වන විටත් විගණනය සඳහා ඉදිරිපත් කර නොතිබුණි. | 2019/2020 මූල්‍ය ප්‍රකාශන අගෝස්තු මස 31 වැනි දින වන විට, 2020/2021 ඔක්තෝම්බර් 31 දිනට හා 2021/2022 දෙසැම්බර් 31 දිනට ප්‍රථම ඉදිරිපත් කිරීමට උපදෙස් ලබා දෙන ලදී. | චක්‍රලේඛය ප්‍රකාරව නියමිත දිනට ගිණුම් ඉදිරිපත් කළ යුතුය. |

**2.2 නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම.**

-----------------------------------------------------------------------------

පහත සඳහන් අනුකූල නොවීම් නිරීක්ෂණය විය.

| | විෂය<br>-----<br>නීති රීති රෙගුලාසි ආදියට යොමුව<br>------------------------ | අනුකූල නොවීම<br>----------------- | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම<br>--------------------- | නිර්දේශය<br>------------ |
|---|---|---|---|---|
| (අ) | 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 41(2) (උ) වගන්තිය. | 2007 අංක 07 දරන සමාගම් පනත යටතේ ලියාපදිංචි වී ඇති හෝ ලියාපදිංචි වී ඇති බවට සලකනු ලබන සහ ස්වකීය කොටස්වලින් සියයට පනහක් හෝ ඊට වැඩි ප්‍රතිශතයක් රජය හෝ රාජ්‍ය සංස්ථාවක් හෝ පළාත් පාලන ආයතනයක් විසින් දරනු ලබන සමාගමක් සඳහා විගණන හා කළමනාකරණ කමිටු පිහිටුවිය යුතු වුවත් සමාගම විසින් ඒ අනුව කටයුතු කර නොතිබුණි. | ඉදිරියේ දී විගණන හා කළමනාකරණ කමිටු පිහිටුවා ඉදිරි කටයුතු සිදු කිරීමට උපදෙස් ලබා දෙන ලදී. | චක්‍රලේඛ උපදෙස් ප්‍රකාරව කටයුතු කළ යුතුය. |
| (ආ) | 2003 ජුනි 02 දිනැති අංක දරන පී.ඊ.ඩී/12 රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තු චක්‍රලේඛය | | | |
| (i) | 4.2.2 ඡේදය | සභාවේ කාර්ය සාධනය ඇගයීම හා අවශ්‍ය පාලනයන් ස්ථාපිත කිරීම සඳහා අධ්‍යක්ෂක මණ්ඩලය මාසිකව රැස්විය යුතු වුවත්, සමාලෝචිත වර්ෂය තුළදී රැස්වීම් වාර පහක් පමණක් පවත්වා තිබුණි. | කොවිඩ් තත්ත්වය මත අධ්‍යක්ෂ මණ්ඩල පැවැත්වීමට නොහැකි වූ බැවින් ඉදිරියේ දී නිසි ලෙස පවත්වාගෙන යාමට උපදෙස් ලබා දෙන ලදී. | චක්‍රලේඛ උපදෙස් ප්‍රකාරව කටයුතු කළ යුතුය. |
| (ii) | 5.2.3 හා 4 ඡේදය | වාර්ෂික අයවැය ඇස්තමේන්තු සකස් කර අනුමත කර නොතිබුණි. | අයවැය ඇස්තමේන්තුව සකස් කිරීමට ගිණුම් අංශය වෙත උපදෙස් ලබා දී ඇත. | චක්‍රලේඛ උපදෙස් ප්‍රකාරව කටයුතු කළ යුතුය. |
| (iii) | 6.5 ඡේදය | සමාගම විසින් වාර්ෂික වාර්තා පිළියෙළ කර පාර්ලිමේන්තුවේ සභාගත කිරීමට කටයුතු කර නොතිබුණි. | මේ වන විට වාර්ෂික වාර්තා සකස් කරමින් පවතී. | චක්‍රලේඛ උපදෙස් ප්‍රකාරව කටයුතු කළ යුතුය. |

| | | | | |
|---|---|---|---|---|
| (iv) | 7.4.5 ඡේදය | ස්ථාවර වත්කම් සහ ගබඩා සත්‍යාපනය සඳහා වාර්ෂික භාණ්ඩ සමීක්ෂණ මණ්ඩල පත්කර භාණ්ඩ සමීක්ෂණයක් සිදුකළ යුතු වුවත්, සමාගම විසින් 2016 වර්ෂයෙන් පසුව භාණ්ඩ සමීක්ෂණයක් සිදුකර නොතිබුණි. | භාණ්ඩ සමීක්ෂණ මණ්ඩලයක් පත් කර අදාළ කටයුතු සිදු කරමින් පවතී. | චක්‍රලේඛ උපදෙස් ප්‍රකාරව කටයුතු කළ යුතුය. |
| (ඇ) | 2014 පෙබරවාරි 17 දිනැති අංක 01/2014 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛය | ව්‍යාපාර කටයුතු කෙටි කාලීන හා දිගුකාලීන දැක්මක් සහිතව කළමනාකරණය කිරීම සඳහා සංයුක්ත සැලැස්මක් සහ ඉදිරි මුදල් වර්ෂයේදී ක්‍රියාවට නැංවීමට අපේක්ෂිත ක්‍රියාකාරකම් ඇතුළත් කර වාර්ෂික ක්‍රියාකාරී සැලැස්මක් සකස් කර නොතිබුණි. | සකස් කරන ලද වාර්ෂික වාර්තාව මේ සමඟ ඉදිරිපත් කරමි. | චක්‍රලේඛ උපදෙස් ප්‍රකාරව කටයුතු කළ යුතුය. |
| (ඈ) | 1958 අංක 15 දරන සේවක අර්ථ සාධක අරමුදල් පනතේpp | | | |
| | (i) 10 වන වගන්තියේ 2 වන අනු වගන්තිය. | සේවක අර්ථ සාධක දායක මුදල් එක් එක් මාසය වෙනුවෙන් ඊළඟට එළඹෙන මාසයේ අවසාන දිනට පෙර සේවක අර්ථ සාධක අරමුදල වෙත ගෙවිය යුතු වුවත්, අවස්ථා හතරකදී එකතුව රු. 3,408,357 ක් වූ දායක මුදල් මාස 01 ත් 03 ත් අතර කාල ප්‍රමාදයකින් යුක්තව ගෙවීම් කර තිබුණි. | කොවිඩ් තත්ත්වය මත සමාගමේ රාජකාරී කටයුතු හා මූල්‍ය තත්ත්වය අයහපත්වීමත් ලැබිය යුතු ණය මුදල් නියමිත වේලාවට නොලැබී යාමත් නිසා මූල්‍ය තත්ත්වය යහපත් වූ පසු අදාළ ගෙවීම් කිරීමට කටයුතු කරන බව දන්වා සිටිමි. | චක්‍රලේඛ ප්‍රකාරව කටයුතු කළ යුතුය. |
| | (ii) 16 වන වගන්තිය | සේවා නියුක්තිකයකු සම්බන්ධයෙන් සේවා යෝජක විසින් ගෙවිය යුතු දායක මුදල් නියමිත දිනයේදී නොගෙවීම මත එක් නිලධාරියකු වෙනුවෙන් ගෙවිය යුතු සේවක අර්ථ සාධක දායක මුදල රු. 74,130 ක් හා එයට අදාල අධිභාරය රු. 37,065 ක් ලෙස එකතුව රු. 111,195 ක් වාරික වශයෙන් ගෙවා තිබුණි. | ආරක්ෂක සේවය ස්ථිර නොවන හෙයින් සෑම අයෙකුගේම දායක මුදල් ගෙවීම සිදු කරනු ලබන්නේ ඔහුගේ පැමිණීම මත මාස 03 ක් පමණ නිරීක්ෂණය කරමිනි. එබැවින් එම නිළධාරියා පැමිණ දින සිට අර්ථ සාධක අරමුදල් ගෙවීම සිදු කළ යුතු බවට කම්කරු කාරියාලයේ පැමිණිල්ලක් ගොනු කර ඇත. ඒ අනුව එම මුදල් පසුව ගෙවීම් කර ඇති බැවින් ඉදිරියේ දී එවැනි සිදුවීම් සිදු නොවීමට කටයුතු කිරීමට උපදෙස් ලබා දෙන ලදී. | චක්‍රලේඛ ප්‍රකාරව කටයුතු කළ යුතුය. |

| | | | | |
|---|---|---|---|---|
| (ඉ) | 1980 අංක 46 දරන සේවා නියුක්තිකයන්ගේ භාර අරමුදල් පනතේ 16 වන වගන්තියේ 1 වන අනු වගන්තිය. | සේවා නියුක්තිකයකු සම්බන්ධයෙන් සේවා යෝජක විසින් ගෙවිය යුතු දායක මුදල් එක් එක් මාසය වෙනුවෙන් ඊළඟට එළඹෙන මාසයේ අවසාන දින හෝ එදිනට පෙර සේවා නියුක්ත අරමුදලට ගෙවිය යුතු වුවත්, අවස්ථා තුනකදී එකතුව රු. 399,266 ක් වූ දායක මුදල් මාස 01 ත් 03 ත් අතර කාල ප්‍රමාදයකින් යුක්තව ගෙවීම් කර තිබුණි. | කොවිඩ් තත්ත්වය මත සමාගමේ රාජකාරී කටයුතු හා මූල්‍ය තත්ත්වය අයහපත්වීමත් ලැබිය යුතු ණය මුදල් නියමිත වේලාවට නොලැබී යාමත් නිසා මූල්‍ය තත්ත්වය යහපත් වූ පසු අදාළ ගෙවීම් කිරීමට කටයුතු කරන බව දන්වා සිටිමි. | චක්‍රලේඛ ප්‍රකාරව කටයුතු කළ යුතුය. |
| (ඊ) | රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහය | | | |
| | 4.2.1 (අ) ඡේදය | ප්‍රසම්පාදන අස්ථිත්වය විසින් ප්‍රධාන ප්‍රසම්පාදන සැලැස්මක් සකස් කළ යුතු වුවත්, සමාගම විසින් එසේ කටයුතු කර නොතිබුණි. | ප්‍රසම්පාදන සැලැස්ම සකස් කිරීම සඳහා ගිණුම් අංශයට උපදෙස් ලබා දී ඇත. | මාර්ගෝපදේශ ප්‍රකාරව කටයුතු කළ යුතුය. |

## 3. මෙහෙයුම් සමාලෝචනය

-----------------------------

### 3.1 කළමනාකරණ අකාර්යක්ෂමතා

-----------------------------------

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| (අ) සමාගමේ මුද්‍රණාලය සඳහා සමාලෝචිත වර්ෂයට ඉදිරි සැලසුම් සකස් කර අපේක්ෂිත ඉලක්කයන් හඳුනාගෙන නොතිබුණු අතර 2018 වර්ෂය වෙනුවෙන් සකස් කළ සැලැස්මට අනුව අපේක්ෂිත ආදායම් තත්ත්වය කරා ළඟාවීමට 2020 වර්ෂය දක්වා නොහැකි වී තිබුණි. සමාලෝචිත වර්ෂයේදී ජාතික තරුණ සේවා සභාවට සේවා සැපයීම තුළින් රු. 3,697,748 ක ආදායමක් උපයා තිබුණද එය අපේක්ෂිත ආදායමෙන් සියයට 1.9 ක් විය. සමාලෝචිත වර්ෂයේදී බාහිර පාර්ශවයන්ට සේවා සැපයීම තුළින් රු. 4,000 ආදායමක් උපයා තිබුණද එය අපේක්ෂිත ආදායමෙන් සියයට 0.006 ක් විය. එමෙන්ම මුද්‍රණාලයේ 2018 වර්ෂයේ වාර්ෂික ආදායම රු. 16,968,205 ක්ව පැවති ආදායම 2020 වර්ෂය වන විට රු. 4,696,748 ක් විය. එය ප්‍රතිශතයක් ලෙස සියයට 72 ක අඩු වීමක් වන අතර සමාගමේ මුද්‍රණාලයේ ආදායම් වැඩිකර ගැනීම කෙරෙහි කළමණාකරණය කිසිඳු ක්‍රියාමාර්ගයක් ගෙන නොමැති බව නිරීක්ෂණය විය. | නව කළමනාකාරීත්වය මඟින් මුද්‍රණාලය පිළිබඳව නිරීක්ෂණය කර ආදායම් ඉපයීම සඳහා මුද්‍රණාලය තුළින් සේවකයින් තිදෙනෙකු නම් කර ඔවුන්ට බාහිර ඇණවුම් ලබා ගැනීම සඳහා යොමුකර ලැබෙන ඇණවුම් සඳහා 3% ක ලාභාංශයක් ලබා දීමට තීරණය කරන ලදී. | ආදායම ප්‍රවර්ධනය කර ගැනීම සඳහා විධිමත් වැඩ පිළිවෙළක් ක්‍රියාත්මක කළ යුතුය. |

| | | |
|---|---|---|
| (ආ) සී/ස ශ්‍රී ලංකා තරුණ සේවා පුද්ගලික සමාගමේ මුද්‍රණ අංශයේ කටයුතුවල නියුතු සේවකයන් සඳහා ගෙවන ලද වේතනය හා එම අංශයෙන් ඉපයූ වාර්ෂික ආදායම පරීක්ෂා කිරීමේදී 2020 වර්ෂයේ උපයන ලද ආදායම රු. 3,701,748 ක් වුවද ගෙවූ වේතනය රු. 6,043,284 ක් විය. ඒ අනුව 2020 වර්ෂයේ ඉපයූ ආදායම ඉක්මවා රු. 2,341,536 ක් එනම් සමස්ථ ආදායමෙන් වැටුප් වියදම ලෙස සියයට 163 ක් ගෙවා තිබුණි. ඒ අනුව මුද්‍රණාලයේ ආදායම ප්‍රවර්ධනය කර ගැනීම සඳහා ඇනවුම් ලබාගෙන අක්‍රීය ශ්‍රම පැයක වටිනාකම අඩුකර ගැනීමට කළමනාකරණය කටයුතු කර නොතිබුණු බව නිරීක්ෂණය විය. | මෙම කාල වකවානුව තුළ පැවති කොවිඩ් තත්වය මත මුද්‍රණ ඇණවුම් සිදු කිරීමට අපහසු වූ අතර, සියලුම සේවකයින් ස්ථිර සේවකයන් බැවින් සේවයට නොපැමිණියන් හට වැටුප් ගෙවීම් සිදු කිරීමට සිදුවිය. | ව්‍යාපාර කටයුතු ලාභ ලබන තත්ත්වයෙන් පවත්වාගෙන යාමට කටයුතු කළ යුතුය. |
| (ඇ) තරුණ පරපුරට සාමාජික හා ආර්ථික වශයෙන් යහපත් ජීවන තත්ත්වයක් ඇති කිරීම උදෙසා සී/ස ශ්‍රී ලංකා තරුණ සේවා පුද්ගලික සමාගම යටතේ 1983 වර්ෂයේ අරමුණු 06 ක් ඉටුකර ගැනීමේ අපේක්ෂාවෙන් තරුණ සේවා නමින් මුද්‍රණාලයක් ආරම්භ කර තිබුණද සමාලෝචිත වර්ෂය වන විට ආරම්භ කර වසර 37 ක් ගත වී තිබුණද අපේක්ෂිත අරමුණු කිසිවක් ඉටුකර ගැනීමට කළමනාකරණයට නොහැකි වී තිබුණි. | තරුණ පරපුරට රැකියා සැපයීමේ අරමුණින් සමාගම ආරම්භ කළ ද ඒ කාලය තුළ මුද්‍රණාලයෙන් විශාල පුහුණුවක් තරුණ තරුණියන්ට ලබා දුන් අතර, එකම මුද්‍රණ යන්ත්‍රයක පමණක් තරුණ සේවා සමාගම සතුව තිබුණ බැවින් දිගින් දිගටම පුහුණුව ලබා දීම පසු කාලයේ දී අපහසු විය. නමුත් මුද්‍රණාලයේ පුහුණුව ලැබූ පිරිසක්ම මුද්‍රණාලයේ ස්ථිර සේවයට බඳවා ගත් අතර, දැනටත් එම සේවකයින් සේවයේ යෙදෙන බව ද තවත් කොටසක් බාහිර ආයතන සඳහා යොමු කර ඇති බවත් දැනට ඇති මුද්‍රණ යන්ත්‍රයෙන් ඉලක්ක කරා යාමට අපහසු බවත් දන්වමි. | අපේක්ෂිත අරමුණු ඉටුකර ගැනීම කෙරෙහි කළමනාකරණයේ විශේෂ අවධානය යොමු කළ යුතුය. |
| (ඈ) නව තරුණ යුගල් ත්‍රිත්වයක් අනුයුක්ත කර ගනිමින් අලෙවිකරණ කණ්ඩායමක් ලෙස පුහුණු කර අලෙවිකරණ ව්‍යාපාරයක් දියත් කිරීමත්, ප්‍රාථමික මට්ටමේ ආයතනවල බිල්පොත් ආදී මුද්‍රණ ඇනවුම් භාරගැනීම හා නව තාක්ෂණික ක්‍රම ඔස්සේ සේවා සපයමින් අලෙවිය වැඩිකර ගැනීමට මුද්‍රණාලය විසින් 2018 වර්ෂයේ සැලසුම් කර තිබුණද, සමාලෝචිත වර්ෂය දක්වා එම සැලසුම් ක්‍රියාත්මක කර නොතිබුණි. | මේ වන විටත් එම කටයුතු සඳහා කිහිපදෙනෙකු යොමු කර ඇත. | සැලසුම්වලට අනුව වැඩසටහන් ක්‍රියාත්මක කළ යුතුය. |

| | | |
|---|---|---|
| (ඉ) සමාගමේ මුද්‍රණ අංශයේ පැවති ගබඩාව සතු තොගවලින් තොග අයිතමයන් 36 ක තොග මට්ටම ශූන්‍ය වී තිබුණි. තොගවල යළි ඇණවුම් ප්‍රමාණය යළි ඇණවුම් මට්ටම අවම තොග මට්ටම හා උපරිම තොග මට්ටම ආදිය ගණනය කර නොතිබුණු අතර ප්‍රශස්ථ තොග මට්ටමක් පවත්වාගෙන යමින් මුද්‍රණ කටයුතු විධිමත්ව කරගෙන යාමට ඉහළ කළමනාකරණයේ අවධානය යොමු නොකිරීම හේතුවෙන් ඇණවුම් කාර්යයන් 05 ක ඒකක 55775 ක් ඇණවුම් ලබාදී මසකට වඩා වැඩි කාලයක් ඇණවුම ඉටුකර ගැනීමට නොහැකිවී තිබුණි. | මුද්‍රණාලයේ ගබඩාව තුළ ඇති වූ අපහසුතා (ජලය ගලා ඒම,මීයන් හා කාවුන් වැඩි වශයෙන් සිටීම, වේයන් අධිකව පැවතීම) මත භාණ්ඩ තොග ලෙස රැස්කර තැබීමට නොහැකි වූ අතර, අදාළ ඇණවුම් සඳහා පමණක් භාණ්ඩ මිලදී ගැනීම් සිදු කරන ලදී. | ප්‍රශස්ථ තොග මට්ටමක් පවත්වා ගනිමින් මුද්‍රණ කටයුතු විධිමත්ව කරගෙන යාමට කළමනාකරණයේ අවධානය යොමු කළ යුතුය. |
| (ඊ) සී/ස ශ්‍රී ලංකා තරුණ සේවා පුද්ගලික සමාගම සඳහා ගණකාධිකාරීවරයකු පත්කර ගැනීම සඳහා 2013 වර්ෂයේ සිට කටයුතු කර නොතිබුණු අතර සහකාර ගණකාධිකාරී තනතුරද 2019 ජුනි 03 දින සිට පුරප්පාඩුව පැවතුණි. මෙම තත්ත්වය අවසන් මූල්‍ය ප්‍රකාශන විගණනයට කාලීනව ඉදිරිපත් නොවීමටද හේතු වී තිබුණි. | ගණකාධිකාරී පුරප්පාඩුව සඳහා බඳවා ගැනීමට කටයුතු කරමින් පවතී. බඳවා ගැනීමේ කටයුතු සිදුවන තෙක් තාවකාලිකව මූල්‍ය උපදේශක මහතෙකු කොන්ත්‍රාත් පදනම මත සේවයේ යොදවා ඇත. | බඳවාගැනීමේ පටිපාටිය අනුව පුරප්පාඩු පිරවීමට කටයුතු කළ යුතුය. |